පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය

ඇගයීම් වාර්තාව 2021

10 භූගෝල විද්‍යාව

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය-2021

ඇගයීම් වාර්තාව

10 - භූගෝල විද්‍යාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්‍ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව පිරිවෙන් සාමාන්‍ය පෙළ විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

පෙරදී මූලික පිරිවෙන් අවසාන විභාගය ලෙස හැඳින් වූ මෙය 2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස හැඳින් වූ අතර මෙම විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්ය වරුන් ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පිරිවෙන් සාමාන්‍ය පෙළ අවසාන විභාගය - 2021 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත.
මූලික පිරිවෙන් භූගෝල විද්‍යාව විෂයයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මකව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

IIවන මාතෘකාව යටතේ I පත්‍රයේ ව්‍යූහය , I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය , I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේද I ප්‍රශ්න පත්‍රයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනාද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතරවන හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කරගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයින්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මඟින් ලබාගත් තොරතුරුද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රියව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2024.07.31

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාව පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායක හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

2018 වර්ෂයයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස හැඳින් වූ මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගයේ දී අපේක්ෂයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතුය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතුය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරින්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

උපදේශකත්වය	:	එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා අධීක්ෂණය	:	ඩී. ඩී. වයි. සමරසිංහ නියෝජ්‍ය විභාග කොමසාරිස් පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග
සම්බන්ධීකරණය හා සංවිධානය	:	ඉෂානි වෙත්තසිංහ නියෝජ්‍ය විභාග කොමසාරිස් පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග
විෂය සම්බන්ධීකරණය	:	ඩබ්. එස්. ඩී. වීරසිංහ නියෝජ්‍ය විභාග කොමසාරිස් පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග
සංස්කරණය	:	ආර්. පී පීරිස් මයා අතිරේක විභාග කොමසාරිස් (විශ්‍රාමික) 321/6 ජෝතිකාරාම මාවත කළල්ගොඩ, පන්නිපිටිය
	:	එම්. පී. රංජනී ධනවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය මහරගම
ලේඛක මණ්ඩලය	:	ආර්. පී පීරිස් මයා අතිරේක විභාග කොමසාරිස් (විශ්‍රාමික) 321/6 පෝතිකාරාම මාවත කළල්ගොඩ, පන්නිපිටිය
	:	එම්. පී. රංජනී ධනවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය මහරගම
	:	ඩී. ඩබ්. පී. ජේ බණ්ඩාර සහකාර කථිකාචාර්ය සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය මහරගම

ලේඛක මණ්ඩලය	:	ආර්. ඒ. එස්. කේ. විජේරත්න ගුරු සේවය මප/හගු විද්‍යාකීර්ති මහා පිරිවෙණ තිස්සපාල, හඟුරන්කෙත
පරිගණක පිටපත සැකසුම	:	ඩී. ඒ. අයේෂා මධුවන්ති දත්ත සටහන් සහකාර
පිටකවරය නිර්මාණය	:	ඒ. කේ. එල්. චතුරාණි කළමනාකරණ සේවා නිලධාරී

පටුන

පිටු අංකය

හැඳින්වීම i
පෙරවදන ii
පටුන **v**
වගු නාමාවලිය හා ප්‍රස්තාර නාමාවලිය vi

1. භූගෝල විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු 01
    - 1.1. භූගෝල විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු 01
    - 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු 02

I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය 05

2. **I** ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු 06
- 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 06
- 2.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න 1 සිට 40 දක්වා) 07
- 2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය 12
- 2.4 තේමා අනුව I ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර ඇති අකාරය හා විශ්ලේෂණය 14
- 2.5 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජන 16

II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය 18

`

3. **II** ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු **19**
- 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 19
- 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය 20
- 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය 20
- 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 21
- 3.5 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය 22
- 3.6 II ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 40

4. පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු 41
5. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා 42

වගු නාමාවලිය පිටු අංකය

වගුව 1.1	විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව	02
වගුව 1.2	අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය	02
වගුව 1.3	පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව	03
වගුව 1.4	ලකුණු ලබාගෙන ඇති ආකාරය පන්ති ප්‍රාන්තර අනුව	04
වගුව 2.1	I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය	11
වගුව 2.2	තේමාව හා ඊට අදාළ ප්‍රශ්න අංක	14
වගුව 2.3	තේමාව අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය සහ ඒවායේ පහසුතාව	15

ප්‍රස්තාර නාමාවලිය පිටු අංකය

ප්‍රස්තාරය 2.1	I පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය	12
ප්‍රස්තාරය 2.2	තේමා අනුව අයිතම විශ්ලේෂණය	13
ප්‍රස්තාරය 2.3	තේමාවෙහි පහසුතා දර්ශකය හා තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් ඇති ප්‍රතිශතය	15
ප්‍රස්තාරය 3.1	II පත්‍රය - ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය	20
ප්‍රස්තාරය 3.2	II පත්‍රය - ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය	20
ප්‍රස්තාරය 3.3	II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයේ කොටස්වල/අනු කොටස්වල පහසුතා දර්ශක	21
ප්‍රස්තාරය 3.4(a)	1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය	24
ප්‍රස්තාරය 3.4(b)	1 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව	24
ප්‍රස්තාරය 3.5(a)	2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය	27
ප්‍රස්තාරය 3.5(b)	2 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව	27
ප්‍රස්තාරය 3.6(a)	3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය	29
ප්‍රස්තාරය 3.6(b)	3 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව	29
ප්‍රස්තාරය 3.7(a)	4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය	31
ප්‍රස්තාරය 3.7(b)	4 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව	31
ප්‍රස්තාරය 3.8(a)	5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය	33
ප්‍රස්තාරය 3.8(b)	5 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව	33
ප්‍රස්තාරය 3.9(a)	6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය	35
ප්‍රස්තාරය 3.9(b)	6 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව	35
ප්‍රස්තාරය 3.10(a)	7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය	37
ප්‍රස්තාරය 3.10(b)	7 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව	37
ප්‍රස්තාරය 3.11(a)	8 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය	39
ප්‍රස්තාරය 3.11(b)	8 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව	39
ප්‍රස්තාරය 3.12	II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ප්‍රතිශතය, ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන	40

1. භූගෝල විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 භූගෝල විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු

01. පරිසරය හා මිනිසා අතර සබඳතාව හදාරන විෂයයක් ලෙස භූගෝල විද්‍යාව විෂයය අධ්‍යයනය කිරීම.

02. භෞතික හා මානුෂ භූ දර්ශනයේ සංරචක ගති ලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීම.

03. සෞරග්‍රහ මණ්ඩලයේ ස්වභාවය හා එහි ක්‍රියාකාරිත්වය විමර්ශනය කිරීම.

04. ශ්‍රී ලංකාවේ දේශගුණික විශේෂත්වය අගය කිරීම.

05. ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් හඳුනා ගැනීම.

06. තමා ජීවත්වන ලෝකයේ විවිධත්වය තේරුම් ගෙන, එකිනෙකා සමඟත්, පරිසරය සමගත් සුසංයෝගීව ජීවත්වීමට හුරු වීම.

07. ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජය ගැනීමට උපකාරී වන සුවිශේෂී දිවිරැකුම් කුසලතා වර්ධනය කර ගැනීම.

08. භූගෝලීය තොරතුරු ව්‍යාප්තිය නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් භාවිත කිරීමට හුරු වීම.

09. දත්ත හා තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිතයට හුරු වීම.

10. වැඩ ලෝකයට සක්‍රීය ලෙස සහභාගී වීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම.

භූගෝල විද්‍යාව විෂය නිර්දේශය (2017)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

වගුව 1.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

මාධ්‍යය	පිරිවෙන්	පෞද්ගලික	එකතුව
සිංහල	470	8	478
ඉංග්‍රීසි	1	00	1
එකතුව	**471**	**8**	**479**

වගුව 1.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පිරිවෙන් අපේක්ෂකයන්		පෞද්ගලික අපේක්ෂකයන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	17	3.6	2	25	19	3.97
B	56	11.9	1	12.5	57	11.90
C	181	38.4	2	25	183	38.20
S	147	31.2	1	12.5	148	30.90
W	70	14.9	2	25	72	15.03
එකතුව	**471**	**100.00**	**8**	**100.00**	**479**	**100.00**

වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමාර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන (B) සාමාර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමාර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	5	0	0.00	1	20.00	2	40.00	2	40.00	5	100.00	0	0.00
ගම්පහ	34	0	0.00	3	8.82	16	47.06	11	32.35	30	88.24	4	11.76
කළුතර	34	2	5.88	4	11.76	15	44.12	9	26.47	30	88.24	4	11.76
මහනුවර	47	3	6.38	13	27.66	16	34.04	12	25.53	44	93.62	3	6.38
මාතලේ	32	0	0.00	0	0.00	9	28.13	13	40.63	22	68.75	10	31.25
නුවරඑළිය	13	0	0.00	0	0.00	6	46.15	5	38.46	11	84.62	2	15.38
ගාල්ල	24	1	4.17	1	4.17	15	62.50	6	25.00	23	95.83	1	4.17
මාතර	46	4	8.70	9	19.57	23	50.00	9	19.57	45	97.83	1	2.17
හම්බන්තොට	27	0	0.00	3	11.11	14	51.85	10	37.04	27	100.00	0	0.00
වවුනියාව	0	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00
අම්පාර	25	3	12.00	6	24.00	8	32.00	6	24.00	23	92.00	2	8.00
ත්‍රිකුණාමලය	0	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00
කුරුණෑගල	55	5	9.09	7	12.73	16	29.09	20	36.36	48	87.27	7	12.73
පුත්තලම	5	1	20.00	1	20.00	2	40.00	1	20.00	5	100.00	0	0.00
අනුරාධපුර	17	0	0.00	1	5.88	4	23.53	7	41.18	12	70.59	5	29.41
පොළොන්නරුව	12	0	0.00	1	8.33	5	41.67	2	16.67	8	66.67	4	33.33
බදුල්ල	47	0	0.00	1	2.13	12	25.53	18	38.30	31	65.96	16	34.04
මොණරාගල	13	0	0.00	1	7.69	3	23.08	5	38.46	9	69.23	4	30.77
රත්නපුර	5	0	0.00	0	0.00	1	20.00	2	40.00	3	60.00	2	40.00
කෑගල්ල	38	0	0.00	5	13.16	16	42.11	10	26.32	31	81.58	7	18.42
සමස්ත ප්‍රතිඵලය	479	19	3.97	57	11.90	183	38.20	148	30.90	407	84.97	72	15.03

වගුව 1.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	0	0.00	479	100.00
81 - 90	1	0.21	479	100.00
71 - 80	15	3.13	478	99.79
61 - 70	51	10.65	463	96.66
51 - 60	89	18.58	412	86.01
41 - 50	130	27.14	323	67.43
31 - 40	115	24.01	193	40.29
21 - 30	66	13.78	78	16.29
11 - 20	12	2.51	12	2.51
01 - 10	0	0.00	0	0.00
00 - 00	0	0.00	0	0.00

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- 31 - 40 පන්ති ප්‍රාන්තරය සැලකීමේදී,
මෙම විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 479 අතුරෙන් 31- 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 115කි. එය ප්‍රතිශතයක් වශයෙන් 24.01%කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 193ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 40.29%කි. එමෙන්ම ලකුණු 10ට අඩුවෙන් ලබාගත් සහ ලකුණු 90ට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් කිසිවෙකු නොමැති වීම ද විශේෂත්වයකි.

I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

I පත්‍රය - කාලය පැය 01 - වාස්තවික වර්ගයේ ප්‍රශ්න 40කින් සමන්විත ය.

මෙය අනිවාර්ය ප්‍රශ්න 40කින් යුක්ත ය. ඒවා පහත සඳහන් පරිදි සකස් වී ඇත.

- ප්‍රශ්න අංක 1 සිට 10 දක්වා වරණ තුනක් අතරින් නිවැරදි වරණය තෝරා කෙටි පිළිතුරු සැපයීම සඳහා සකස් කර ඇත.
- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශවල වැරදි නිවැරදි බව තේරීම සඳහා සකස් කර ඇත.
- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා කෙටි පිළිතුරු සැපයීම සඳහා සකස් කර ඇත.
- ප්‍රශ්න අංක 21 සිට 40 දක්වා වරණ හතරක් අතරින් නිවැරදි වරණය තේරීම සඳහා සකස් කර ඇත.
- එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

2.2 I ප්‍රශ්න පත්‍රය

⁕ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය. *(ලකුණු 01 × 40 = 40 යි)*
⁕ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා, **තිත් ඉර මත** ලියන්න.

1. සෙල්සියස් 0^{o} හිමාංකය වන අතර සෙල්සියස් .... තාපාංකය වේ.
   (32^{o} / 100^{o} / 212^{o})

2. ශ්‍රී ලංකාවට බලපාන වාසුළිවල උපත බහුලව සිදුවන්නේ .... ප්‍රදේශයේ ය.
   (බෙංගාල බොක්ක, අරාබි මුහුද, පෝක් සමුද්‍ර සන්ධිය)

3. ශ්‍රී ලංකාවේ ගංගා නිම්න හා ඒ අවට තැනිතලා බිම්වල .... ව්‍යාප්තව පවතී.
   (දියළු පස, කබොක් මිශ්‍ර රතු පස, රතු දුඹුරු ලැටසෝල් පස)

4. මිනිරන් නිර්මාණය වන්නේ .... විපරීතකරණයට පත් වීමෙනි.
   (හුණුගල්, ගල්අඟුරු, වැලිගල්)

5. සුළු අපනයන බෝග අතුරින් ශ්‍රී ලංකාවට වැඩිම ආදායමක් ගෙන දෙන බෝගය වන්නේ .... ය.
   (කරදමුංගු, ගම්මිරිස්, කුරුඳු)

6. ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාවෙන් 75% ක් පමණ .... ප්‍රදේශවල ව්‍යාප්තව සිටිති.
   (ග්‍රාමීය, නාගරික, වතු)

7. මෑත දී ඉදිකරන ලද 'තම්බපවනි' සුළං විදුලි උද්‍යානය .... දූපතේ පිහිටා ඇත.
   (ඩෙල්ෆ්ට්, කයිට්ස්, මන්නාරම)

8. අධිතාක්ෂණික කර්මාන්ත හා තොරතුරු තාක්ෂණික සේවා අයත් වන්නේ .... ආර්ථික ක්‍රියාකාරකම් වර්ගයට ය.
   (ද්විතීයික, තෘතීයික, චතුර්ථක)

9. ඉන්දුනීසියාව, මැඩගස්කර් හා බ්‍රසීලය .... දේශගුණ කලාපයට අයත් රටවල් තුනකි.
   (නිවර්තන, සෞම්‍ය, ශීත)

10. තෙත් බිම් සංරක්ෂණය සඳහා 1977 දී ඇති කරගත් ගෝලීය එකඟතාව .... සම්මුතිය ලෙස හැඳින්වේ.
    (රැම්සා, රියෝ, මොන්ට්‍රියෙල්)

- අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

11. ඉතාලියේ පෝ ගංගා නිම්න ප්‍රදේශයේ සාර්ථකව වී වගා කෙරේ. (නි / වැ)

12. රූපවාහිනිය හා අන්තර්ජාලය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් ලෙස හැඳින්විය හැකි ය. (නි / වැ)

13. කොළඹ, කුරුණෑගල හා මාතලේ අතර ප්‍රදේශය මහා පොල් ත්‍රිකෝණය ලෙස හැඳින්වේ. (නි / වැ)

14. වායුගෝලයේ ඇති ජලවාෂ්ප ප්‍රමාණය වායු පීඩනය ලෙස හැඳින්වේ. (නි / වැ)

15. පෘථිවිය මත කිසියම් ස්ථානයක නිවැරදි පිහිටීම නිශ්චය කිරීම සඳහා ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (GPS) උපයෝගී කරගත හැකි ය. (නි / වැ)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

16. වර්ෂාව මගින් පොළොවට වැටෙන ජලයෙන් කොටසක් පස් අංශු තුළින් පස තුළට කිදා බැස පොළොව ආසන්නයේ තැන්පත් වේ. ඒවා .... ලෙස හැඳින්වේ.

17. ශ්‍රී ලංකාවේ වෙරළ වටා ඇති කලපු, ගංමෝය හා කිවුල් දිය පිරි වගුරු ආශ්‍රිතව .... වෘක්ෂලතා ව්‍යාප්තව ඇත.

18. පොහොර නිපදවීම සඳහා යොදාගන්නා ඇපටයිට් නිධියක් අනුරාධපුර .... ප්‍රදේශයේ පිහිටා ඇත.

19. ඇමසන් හා කොංගෝ ගංගාධාරවල ලොව විශාලතම .... වනාන්තර දැකිය හැකි ය.

20. වර්තමානයේ මෝටර් රථ නිෂ්පාදනය අතින් ප්‍රමුඛස්ථානය ගන්නා රට .... යි.

- අංක **21** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

21. මාර්තු - අප්‍රේල් මාසවලත්, ඔක්තෝබර් - නොවැම්බර් මාසවලත් ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ප්‍රධාන ක්‍රමය වන්නේ කුමක් ද?
    (1) නිරිත දිග මෝසම් (2) ඊසාන දිග මෝසම්
    (3) සංවහන (4) වාසුළි (.........)

22. ශ්‍රී ලංකාවේ කර්මාන්ත අතුරින් ආහාර නිෂ්පාදන හා සම් භාණ්ඩ යන ඒවා අයත් වන කර්මාන්ත කාණ්ඩය තෝරන්න.
    (1) අපනයනයට යොමු වූ කර්මාන්ත (2) සේවා කර්මාන්ත
    (3) ඛනිජ පාදක කර්මාන්ත (4) කෘෂිපාදක කර්මාන්ත (.........)

23. දකුණු ආසියාතික රටවල් අතුරින් අඩුම ජනසංඛ්‍යා වර්ධන වේගයක් ඇති රට කුමක් ද?
    (1) ඉන්දියාව (2) පකිස්තානය (3) ශ්‍රී ලංකාව (4) බංග්ලාදේශය (.........)

24. ලෝකයේ අධි ජන සංකේන්ද්‍රණයක් ලෙස සැලකිය හැක්කේ මින් කුමන ප්‍රදේශය ද?
    (1) මධ්‍යම ඕස්ට්‍රේලියාව (2) ඇමසන් ගංගාධාරය
    (3) උතුරු අප්‍රිකාව (4) ගංගානම් ගංගාධාරය (.........)

25. පැම්පාස්, ප්‍රෙයරීස්, ස්ටෙප්ස් වැනි තෘණභූමි ව්‍යාප්තව ඇත්තේ කුමන දේශගුණ කලාපයේ ද?
    (1) නිවර්තන කලාපය (2) සෞම්‍ය කලාපය
    (3) ශීත කලාපය (4) මෝසම් කලාපය (.........)

26. ලැව්ගිනි ආපදාවට නිරන්තරයෙන් ගොදුරු වන රටක් වන්නේ,
    (1) ඕස්ට්‍රේලියාවයි. (2) මියන්මාරයයි. (3) ඊජිප්තුවයි. (4) ජපානයයි. (.........)

27. අමුද්‍රව්‍ය සාධකය රට තුළ නොමැතිව යකඩ හා වානේ කර්මාන්තය දියුණු මට්ටමක පවත්නා රට කුමක් ද?
    (1) ජපානය (2) චීනය (3) ඉන්දියාව (4) රුසියාව (.........)

28. තෙතමනය රඳාපවත්නා කබොක් මිශ්‍ර රතු පස හා ජලය බැස යන මද බෑවුම් සහිත භූමිය වඩාත් යෝග්‍ය වන්නේ මින් කුමන බෝගයට ද?
    (1) වී (2) තේ (3) රබර් (4) පොල් (.........)

29. ලෝකයේ විද්‍යුත් කර්මාන්තය හා සම්බන්ධ ලක්ෂණයක් නොවන්නේ මින් කවරක් ද?
    (1) අධි තාක්ෂණ ක්‍රම භාවිතය (2) විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කිරීම
    (3) විශේෂඥ දැනුම භාවිතය (4) මහා පරිමාණ යන්ත්‍ර සූත්‍ර භාවිතය (.........)

30. ශ්‍රී ලංකාවේ දැඩි ස්වාභාවික රක්ෂිත පමණක් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
 (1) යාල, මින්නේරිය, මාදුරු ඔය (2) යාල, රිටිගල, වස්ගමුව
 (3) යාල, රිටිගල, හග්ගල (4) යාල, හග්ගල, මින්නේරිය (………)

31. මාරවිල හා නාත්තණ්ඩිය ප්‍රදේශවල බහුලව ව්‍යාප්තව ඇති ඛනිජ වර්ගය කුමක් ද?
 (1) ඉල්මනයිට් (2) සිලිකා වැලි (3) කෙඔලින් (4) මිනිරන් (………)

32. අනුරාධපුර, සීගිරිය හා මහනුවර ප්‍රදේශ අයත් සංචාරක කලාපය හැඳින්වෙන නම කුමක් ද?
 (1) පුරාණ නගර (2) මධ්‍යම කඳුකරය
 (3) උතුරු ප්‍රදේශය (4) නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය (………)

33. ශ්‍රී ලංකාවේ ඉහළම ජෛව විවිධත්වයකින් යුක්ත වෘක්ෂලතා කලාපය වනුයේ,
 (1) වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර ය.
 (2) නිවර්තන තෙත් කලාපීය වනාන්තර ය.
 (3) කඳුකර තෙත් කලාපීය වනාන්තර ය.
 (4) කඳුකර වියළි කලාපීය වනාන්තර ය. (………)

34. ලෝකය මනුෂ්‍ය වාසයට සුදුසු පරිසරයක් ලෙස සකස් වුව ද, මිනිස් ක්‍රියාකාරකම් නිසා එහි පරිහානි ලක්ෂණ මතු වූ බව සඳහන් වන සූත්‍රය කුමක් ද?
 (1) චක්කවත්ති සීහනාද සූත්‍රය (2) වනරෝප සූත්‍රය
 (3) සිඟාලෝවාද සූත්‍රය (4) අග්ගඤ්ඤ සූත්‍රය (………)

35. සමාන්තර හෙල්වැටි පිහිටි ප්‍රදේශයක කොටු දැලක් ආකාරයට කඳුවැටි හා නිම්න අතරින් ගලන ගංගා සහිත ප්‍රදේශයක දක්නට ලැබෙන ජලවහන රටාව වනුයේ,
 (1) ශාඛීය (2) ජාලාකාර (3) අරීය (4) වලයාකාර (………)

- අංක **36** සිට **38** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ප්‍රස්තාරය උපයෝගී කරගන්න.

ශ්‍රී ලංකාවේ තේ අපනයනය 2019 හා 2020



36. වසර දෙකේදී ම ශ්‍රී ලංකාවේ තේ වැඩිම අපනයන ප්‍රමාණයක් සහිත රට කුමක් ද?
 (1) රුසියාව (2) තුර්කිය (3) ඉරාකය (4) ඉරානය (………)

37. වර්ෂ දෙක තුළ දී වැඩිම අපනයන පරතරයක් සහිත රට කුමක් ද?
 (1) තුර්කිය (2) ඉරාකය
 (3) ඉරානය (4) එක්සත් අරාබි එමීර් (………)

38. 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ශ්‍රී ලංකා තේ අපනයන ප්‍රමාණය ඉහළ ගොස් ඇති රට වනුයේ,

(1) රුසියාව ය. (2) තුර්කිය ය. (3) ඉරාකය ය. (4) ඉරානය ය. (………)

- අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සාධක යුගල පහ උපයෝගී කර ගන්න.

A. (i) සංචරණ සීමා පැනවීම
(ii) රෝග පැතිරීම

B. (i) ජන සංඛ්‍යාව වියපත් වීම
(ii) රාජ්‍ය වියදම් ප්‍රමාණය

C. (i) පරිසර දූෂණය
(ii) පිරිසිදු වාතය

D. (i) සංවර්ධිත රටවල්
(ii) පුමිතිරි අනුපාතය

E. (i) පුහුණු ශ්‍රමය
(ii) ආර්ථික සංවර්ධනය

39. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ ද වැඩිවීමට හේතු වන සාධක යුගල දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) *A* සහ *B* (2) *B* සහ *C* (3) *B* සහ *E* (4) *D* සහ *E* (………)

40. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතු වන සාධක යුගල දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) *A* සහ *B* (2) *A* සහ *C* (3) *B* සහ *D* (4) *D* සහ *E* (………)

(ලකුණු 01 × 40 = 40 යි)

වගුව **2.1** I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	100^0	21.	(3)
02.	බෙංගාල බොක්ක	22.	(4)
03.	දියළු පස	23.	(3)
04.	ගල් අඟුරු	24.	(4)
05.	කුරුඳු	25.	(2)
06.	ග්‍රාමීය	26.	(1)
07	මන්නාරම	27.	(1)
08.	චතුර්ථක	28.	(3)
09.	නිවර්තන	29.	(4)
10.	රැම්සා	30.	(3)
11.	(නි)	31.	(2)
12.	(නි)	32.	(1)
13.	(වැ)	33.	(2)
14.	(වැ)	34.	(4)
15.	(නි)	35.	(2)
16.	භූගත ජලය	36.	(2)
17.	කඩොලාන	37.	(3)
18.	එප්පාවල	38.	(1)
19.	නිවර්තන	39.	(3)
20.	චීනය	40.	(2)

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය



ප්‍රස්තාරය 2.1 (RD/16 /5 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

ප්‍රශ්න අංක 01හි පහසුතා දර්ශකය 0.55 කි.එම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 55%ක් නිවැරදි පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම ප්‍රශ්නයේ පහසුතාව 55% ක් ලෙස දැක්විය හැකිය.



ප්‍රස්තාරය 2.2
(RD/16/5/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී)

2.4 තේමා අනුව I ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

වගුව 2.2 තේමාව හා ඊට අදාළ ප්‍රශ්න අංක

තේමාව	ප්‍රශ්න අංක
භෞතික භූගෝල විද්‍යාව	1,2,3,4,9,10,14,16,17,19,21,25,26,29,30,33,
මානුෂ භූගෝල විද්‍යාව	5,6,7,8,11,12,13,18,20,22,23,24,27,28,31,32,34,39,40
ප්‍රායෝගික භූගෝල විද්‍යාව	15,35,36,37,38,

භෞතික භූගෝල විද්‍යාව

භෞතික භූගෝල විද්‍යාව තුළින් ස්වාභාවික පරිසරයේ ක්‍රියාවලි හා රටා පිළිබඳ අධ්‍යයනය කෙරේ. මෙම තේමාව වායුගෝලය, ජල ගෝලය, ශිලා ගෝලය හා ජෛව ගෝලයේ මූලික සංකල්ප පදනම් කරගෙන ඇත. එම තේමාවට අදාළ මුලු ප්‍රශ්න සංඛ්‍යාව 16කි. ඉන් 50%ට වැඩි පහසුතාවක් ඇති ප්‍රශ්න සංඛ්‍යාව 6කි. භෞතික භූගෝල විද්‍යාව තේමාව යටතේ දෙන ලද ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්න අංක 10හි පහසුතාව 100%කි. 2 ප්‍රශ්නයේ පහසුතාව 95%කි. පහසුතාව අඩුම ප්‍රශ්නය වන්නේ ප්‍රශ්න අංක 21යි. එහි පහසුතාව 24%කි. භෞතික භූගෝල විද්‍යාව තේමාව ආශ්‍රයෙන් අසන ලද ප්‍රශ්න වලින් අපහසු ප්‍රශ්නය වී ඇත්තේ මෙයයි. පහසුතාව වැඩි 10 ප්‍රශ්නයෙහි පිළිතුර වන්නේ රැම්සා සම්මුතියයි. එය මතකයෙන් පිළිතුරු දීමට හැකි සරල ප්‍රශ්නයක් වීම එයි පහසුතාව වැඩි වීමට හේතු විය හැකිය. 95% පහසුතාව ඇති දෙවන ප්‍රශ්නය සඳහාද ශිෂ්‍ය සාධනය ඉහළ වීමට එය නිරන්තර ප්‍රවෘත්ති විකාශන වලදී ඇසෙන සරල කරුණක් වීම හේතු විය හැකිය. ප්‍රශ්න අංක 21හි පහසසුතාව අඩු වීමට ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය ලැබෙන කාලය හා ක්‍රමය සැසඳීමෙන් පිළිතුරු තීරණය කිරීමට සිදු වීම හේතු වී තිබිය හැකි බව සිතිය හැකිය.

මානුෂ භූගෝල විද්‍යාව

මානුෂ භූගෝල විද්‍යාව තුළින් මිනිසා හා පරිසරය අතර අන්තර් සම්බන්ධතාව කාලීනව හා අවකාශිය වශයෙන් විග්‍රහ කිරීම සහ මෙය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ අධ්‍යයනය කෙරේ. තේමාවට අදාළව මුළු ප්‍රශ්න සංඛ්‍යාව 19කි. ඉන් 50%ට වැඩි පහසුතාවක් ඇති ප්‍රශ්න සංඛ්‍යාව 8කි. මානුෂ භූගෙ ර්ල විද්‍යා තේමාව යටතේ දෙන ලද ප්‍රශ්න අතරින් පහසුතාව ඉහළම ප්‍රශ්න අංක 12හි පහසුතාව 85%කි. මේ තේමාව යටතේ අසන ලද ප්‍රශ්න වලින් පහසුතාව අඩුම ප්‍රශ්න අංක 24හි පහසුතාව 21%කි. එම ප්‍රශ්නයේ පිළිතුරට සංප්‍රව පෙළ පොතේ තිබෙන කරුණක් අපේක්ෂා නොකෙරේ.නමුත් එහි සඳහන් කරුණු තුළ ඇති කිසියම් විශේෂිත ප්‍රදේශයක් තුළ තිබෙන උප ප්‍රදේශයක් පිළිබඳ පිළිතුරක් අපේක්ෂි කෙරේ.යම් කරුණක් පිළිබඳ අවබෝධයෙන්, ගැඹුරින් අධ්‍යයනට අවස්ථාවක් හෝ ඒ පිළිබඳ අධ්‍යයනයට යොමු කිරීමක් සිදුනොවීම මීට හේතු විය හැකිය.

ප්‍රායෝගික භූගෝල විද්‍යාව

ප්‍රායෝගික භූගෝල විද්‍යාව තුළින් මිනිසා හා පරිසරය අතර ඇති කාලීන හා අවකාශිය සබඳතා හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම, නිරූපනය හා ඉදිරිපත් කිරීම සිදු කෙරේ. එම තේමාවට අදාළ මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි. මෙයින් පහසුතාව වැඩි ම ප්‍රශ්නය අංක 38 වේ. එහි පහසුතාව 98 %කි. පහසුතාව අඩුම ප්‍රශ්න වන්නේ 35 හා 37 යි. ප්‍රශ්න දෙකෙහිම පහසුතාව 39%ක් වේ. 35 ප්‍රශ්නය පහසුතාව අඩුම ප්‍රශ්නයකි.සිතියමක් කියවන විශ්ලේෂණය කිරීමේ හැකියාව නොමැති වීම හා ජලවහන රටා පිළිබඳ පැහැදිළි අවබෝධයක් ලබා නොතිබීම ඊට හේතුවිය හැකිය.37 ප්‍රශ්නය දුෂ්කරවීමට හේතුව ප්‍රස්ථාර විශ්ලේෂණාත් මකව විග්‍රහ කිරීමේ කුසලකව සිසුන් ලබා නොමැති වීම විය හැකිය.

වගුව 2.3 තේමාව අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය සහ ඒවායේ පහසුතාව

තේමාව	පහසුතාව වැඩිම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව	පහසුතාව අඩුම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව
භෞතික භූගෝල විද්‍යාව	10 - 100%	21-24%
මානුෂ භූගෝල විද්‍යාව	12 - 85%	24 -21%
ප්‍රායෝගික භූගෝල විද්‍යාව	38 - 98%	35 , 37 -39%



ප්‍රස්තාරය 2.3

භූගෝල විද්‍යාව I පත්‍රය ප්‍රධාන තේමා තුන අතුරෙන් එක් එක් තේමාවට අයත් පහසුතාව සලකා ඒ ඒ තේමාවෙහි මධ්‍යන්‍ය පහසුතාව හා එම තේමාව යටතේ ප්‍රශ්න ඉදිරිපත් වී තිබූ ප්‍රශ්න ප්‍රතිශතය මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත.

I ප්‍රශ්න පත්‍රය භෞතික භූගෝල විද්‍යාව සහ මානුෂ භූගෝල විද්‍යාවට ආසන්න වශයෙන් සමාන බරක් තැබෙන සේ (ප්‍රශ්න 16 හා 19 බැගින්) සකස්කර ඇත, අවකාශීය ව්‍යාප්තිය කාලින වෙනස්කම් සහ ඒවාට අදාළ මිනිස් පරිසර සබඳතා පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට නම් භෞතික හා මානුෂ භූගෝල විද්‍යා කොටස් දෙකම පිළිබඳ දැනුවත්භාවයක් අවශ්‍ය වේ. ඒ නිසා කොටස් දෙකෙන්ම ආසන්න වශයෙන් සමාන බර තැබීමක් සිදුකර ඇත.

ප්‍රායෝගික භූගෝල විද්‍යාව තේමාවෙන් 1 පත්‍රයෙහි අඩු ප්‍රශ්න සංඛ්‍යාවක් ඇතුළත් වුවද එහි මධ්‍යයන්‍යය පහසුතාව 69%ක් තරම් ඉහළ අගයකි. භූගෝල විද්‍යාව තුළ අන්තර් සම්බන්ධතාව අධ්‍යයනයේ දී ප්‍රායෝගික කොටස ඉතා වැදගත් අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් යොමු කළ යුතුය.

2.5 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

• I පත්‍රයේ ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා දෙවරණ තෙවරණ සහ කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න අන්තර්ගත වේ.

• 75% හෝ ඊට වැඩි පහසුතාවක් සහිත ප්‍රශ්න වනුයේ 2, 5, 10, 12 සහ 15 ය. මෙම ප්‍රශ්න සියල්ල භූගෝල විද්‍යාවේ මූලික සංකල්ප පදනම් කර ගනිමින් සකස් කර ඇත. එමෙන්ම එදිනෙදා අවධානය යොමු කෙරෙන තේමාවන් ආශ්‍රිත වීම ද මෙම ඉහළ ශිෂ්‍ය සාධනයට බලපා ඇති බව කිව හැකිය.

• I පත්‍රයේ ප්‍රශ්න පහසුතාව 35%ට වඩා අඩු ප්‍රශ්න 4 කි. ඒවා නම් ප්‍රශ්න අංක 8,16,18 සහ 19 වේ.

• ප්‍රශ්න අංක 8හි පහසුතාව 23%කි. මෙම ප්‍රශ්නය ලෝකයේ ආර්ථික කටයුතු ඇසුරින් සකස්කර ඇත. එයින් මැනීමට අපේක්ෂා කර ඇත්තේ සංකල්ප පිළිබඳ දැනුමය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ මෙම සංකල්ප පිළිබඳ දැනුම නිසි පරිදි තහවුරු වී නොමැති වීම අඩු ශිෂ්‍ය සාධනයට හේතු විය හැකිය. එම දැනුම වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ.

• ප්‍රශ්න අංක 16,18,19 යන ඒවා සැපයීම් වර්ගයේ ප්‍රශ්න වේ. එයින් ප්‍රශ්න අංක 16 පහසුතාව 32%ක් වන අතර එය ජලය තේමාව ඇසුරින් සකස් කර ඇත. ජලය පවත්නා විවිධ ස්වභාවයන් පිළිබඳ දැනුම මැනිම මෙහි අරමුණ වී ඇත. මෙම ප්‍රශ්නයේ සාපේක්ෂ අඩු පහාසුතාවට අපේක්ෂකයන් තුළ මෙම කරුණ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම හේතු වී තිබිය හැකිය. මෙවැනි කරුණු පහසුවෙන් මතක තබාගත හැකි අකාරයට සිසුන්ට ලබාදීම සඳහා රසවත් හා ප්‍රියජනක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීමට ගුරුවරයා පියවර ගත යුතුය.

• 18,19 ප්‍රශ්න දෙකම ස්ථානීය පිහිටීම් ඇසුරින් සකස්කර ඇත. ප්‍රශ්න අංක 18හි පහසුතාව 28%ක් වන අතර ප්‍රශ්න අංක 19හි පහසුතාව 33%කි. භූගෝල විද්‍යාවේ මූලික සංකල්පයක් වන ස්ථානීය පිහිටීම පිළිබඳ අපේක්ෂකයන් අඩු අවධානයක් යොමු කිරීම අඩු පහසුතාවට හේතු වී ඇති බව සිතිය හැකිය. මේ සඳහා සිතියම් ආශ්‍රිත අභ්‍යාසකරණය නිරන්තරයෙන් සිදු කිරීමෙන් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකිය.

ප්‍රශ්න අංක 21 සිට 40 දක්වා බහුවරණ ප්‍රශ්න අන්තර්ගත වේ.

• I පත්‍රයේ 75%ක් හෝ ඊට වැඩි පහසුතාවක් සහිත ප්‍රශ්න වනුයේ 36 සහ 38 ප්‍රශ්න වේ. මෙම ප්‍රශ්න දෙකම ප්‍රස්තාරය ඇසුරින් අසා ඇත. ප්‍රශ්න අංක 36හි පහසුතාව 91%ක් වන අතර ප්‍රශ්න අංක 38හි පහසුතාව 98%කි. මෙම ප්‍රශ්න දෙකම ප්‍රායෝගික භූගෝල විද්‍යාවට අදාළ විෂය කොටස් ඇසුරින් විමසා ඇත. මෙම ප්‍රශ්නවලින් ප්‍රස්තාරයෙන් ඍජුවම ප්‍රකාශවන දත්තයන් විමසන අතර ඒවා සඳහා පිළිතුරු පහසුවෙන් තෝරාගත හැකිවීම ශිෂ්‍ය සාධනය ඉහළ අගයක් ගැනීමට හේතුවී තිබිය හැකිය.

• I පත්‍රයේ 35%ක් හෝ ඊට වැඩි අඩු පහසුතාවක් සහිත ප්‍රශ්න වන්නේ 21, 24, 29, 30 සහ 34 ප්‍රශ්න වේ. ප්‍රශ්න අංක 21හි පහසුතාවය 24%කි. එය ශ්‍රී ලංකාවේ දේශගුණය පිළිබඳ දැනුම පිරික්සීමේ ප්‍රශ්නයකි. විශ්ලේෂණාත්මක හැකියාව, විවේචනාත්මක චින්තනය වැනි හැකියාවන් වර්ධනය කරන ආකාරයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමෙන් මෙවැනි ප්‍රශ්න සඳහා ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකිය.

• ලෝක ජන සංඛ්‍යාව ඇසුරෙන් සකස් කර ඇති 24 ප්‍රශ්නයෙහි පහසුතාව 21%කි. විෂය කරුණක් පිළිබඳ මතකයෙන් කරුණු ඉදිරිපත් කිරීමකට වඩා ඉගෙන ගන්නා ලද සංකල්ප තවත් තැනකට භාවිත කිරීමේ ඉහළ ප්‍රජානන හැකියාවක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී බලාපොරොත්තු වී ඇති අතර අපේක්ෂකයන් තුළ ප්‍රමාණවත් පරිදි එම හැකියා වර්ධනය වී නොතිබීම මෙම අඩු පහසුතාවට හේතු විය හැකිය. මෙම ඉහළ ප්‍රජානන මට්ටම් කරා ශිෂ්‍යයින්ට ළඟා වීමට හැකි පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම අත්‍යවශ්‍ය වේ.

• ප්‍රශ්න අංක 29හි පහසුතාව 34%ක් වන අතර එය ලෝකයේ කර්මාන්ත ආශ්‍රයෙන් සකස් කර ඇත. විෂය කරුණු පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුවත් බව අඩු වීම පහසුතාවය අඩුවීමට හේතු වී ඇතැයි සිතිය හැකිය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විවිධ ක්‍රමෝපායන් තුළින් සංවර්ධනය කිරීමට කටයුතු කිරීම මගින් මේ පිළිබඳ ශිෂ්‍ය සාධන මට්ටම වැඩි දියුණු කිරීමට කටයුතු කළ හැකිය.

• ප්‍රශ්න අංක 30හි පහසුතාව 39%ක් වන අතර ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් ආශ්‍රයෙන් සකස්කර ඇත. ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය හා පිහිටීම් පිළිබඳ සිසුන් තුළ දැනුම වර්ධනය වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලියට සංවිධානය කර ගැනීමෙන් ශිෂ්‍ය සාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කළ හැකිය.

• ප්‍රශ්න අංක 34 හි පහසුතාවය 32%ක් වන අතර බෞද්ධ පරිසර ආචාර ධර්ම ආශ්‍රයෙන් සකස්කර ඇත. භූගෝල විද්‍යාවට වැදගත්වන බුදු දහමේ සංකල්ප ඇතුළත් සූත්‍ර පිළිබඳ දැනුමේ දුර්වලතා පහසුතාවය අඩු වීමට හේතු වී ඇත යි සිතිය හැකිය. විවිධ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම භාවිතයෙන් පහසුතාව වර්ධනය කර ගත හැකිය.

• සමාජයක් වශයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම, දැනුම, කුසලතා ඉගෙනුම් සම්පත් ආදී සියල්ලම යාවත්කාලීන වීම සහ යවත්කාලීන කිරීම , අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම ආදී ක්‍රියාමාර්ග තුළින් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමට පියවර ගත යුතු අතර වාර්ෂිකව හෝ විෂය බද්ධ ගුරුවරුන් සංවර්ධනය කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමද අත්‍යාවශ්‍යය වේ.

II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

II පත්‍රය - කාලය : පැය 02යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - මෙම කොටස අනිවාර්ය වේ. එය (අ), (ආ), (ඉ) ලෙස අනුකොටස් **තුනකින්** සමන්විත වේ.

(අ) ශ්‍රී ලංකා 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටසක් ඇසුරින් සකස් කෙරෙන ප්‍රශ්න : ලකුණු **10** කි.

(ආ) ශ්‍රී ලංකා සිතියම - ලකුණු කිරීම : ලකුණු **05** කි.

(ඉ) ලෝක සිතියම - ලකුණු කිරීම : ලකුණු **05** කි.

II කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න **හතකින්** ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ලකුණු 40කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 10 + 05 + 05 + 40 = **60**

3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය



ප්‍රස්තාරය 3.1
(RD/ 16 / 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

- භූගෝල විද්‍යාව II පත්‍රයෙහි I කොටසෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. අපේක්ෂකයන් සියලු දෙනාම පිළිතුරු සපයා ඇත.

- II පත්‍රයෙහි II කොටසෙහි ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 7ක් වන අතර ඉන් 4ක් පමණක් තෝරාගෙන පිළිතුරු සැපයීම අපේක්ෂිතය.

- II පත්‍රයෙහි තෝරාගත යුතු ප්‍රශ්න 7න් වැඩිම අපේක්ෂක පිරිසක් එනම් 76.25%ක් පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇත්තේ ප්‍රශ්න අංක 4ය. මෙම ප්‍රශ්නයේ (අ) කොටස ලෝක ජනසංඛ්‍යාව ඇසුරෙන් සකස්කර ඇති අතර (ආ) හා (ඉ) කොටස් ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව ඇසුරින් සකස් කර ඇත. මෙය මානුෂ භූගෝල විද්‍යාව යටතේ ගැනෙන ජනප්‍රිය මාතෘකාවක් වීම නිසා අපේක්ෂකයන් වැඩි පිරිසක් මෙම ප්‍රශ්නය තෝරා ගැනීමට නැඹුරු වී ඇති බව සිතිය හැකිය.

- තෝරාගැනීමට ඇති ප්‍රශ්න 7න් අඩුම අපේක්ෂකයන් පිරිසක්වන 30%ක් පමණ තෝරාගෙන ඇති ප්‍රශ්නය වන්නේ අංක 08 ය. මෙය භෞතික සහ මානුෂ ක්‍රියාකාරකම්වල අන්තර් සම්බන්ධතා පිළිබඳව විමසා බැලෙන ප්‍රශ්නයකි. එමෙන්ම පරිසරය හා බෞද්ධ දර්ශනය පිළිබඳ මෙහිදී අවධානය යොමු කර ඇත. පසුගිය වසරවලදී ද බෞද්ධ පදනම හා භූගෝල විද්‍යාව අතර සම්බන්ධතාව දැක්වෙන ප්‍රශ්න අඩුවෙන් තෝරාගෙන ඇත. භූගෝල විද්‍යා සංකල්ප හා බෞද්ධ ඉගැන්වීම් අතර සම්බන්ධතාව ඉස්මතු වන පරිදි අධ්‍යයන කටයුතු සිදු කිරීමට පියවර ගැනීමට සුදුසුය.

3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය



ප්‍රස්තාරය 3.2
(RD / 16/ 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

මෙම පත්‍රයේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එයට ලකුණු 20ක් ලැබෙන අතර ඉතිරි ප්‍රශ්න 7 සඳහා ලකුණු 10 බැගින් ලබා දී ඇත.
පළමු ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව වන ලකුණු 20 පංති ප්‍රාන්තර 4ට වෙන් කර ඇත. ඒවා නම් 00 - 05 (0% - 25%) , 06 - 10 (25% - 50%) , 11- 15 (51% - 75%) , 16- 20 (76% -100%) ලෙසින් ප්‍රස්තාරයේ දැක්වේ. ඒ අනුව මුළු ලකුණු 20 න් 0 - 05 (0% - 25%) අතර ලකුණු ලබා ගෙන ඇති ප්‍රතිශතය 8.75%කි.
ප්‍රශ්න පත්‍රයේ 2 සිට 8 දක්වා ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 10කි. එය 0 - 02 (0% - 25%) , 3 - 5 (26% - 50%), 6- 7 (51% - 75%), 8 - 10 (76% - 100%) ලෙස ප්‍රස්තාරයේ දැක්වේ.
ප්‍රශ්න අංක සැලකීමේදී මුළු ලකුණු 10න් 3 - 5 (26% - 50%) අතර ලකුණු ලබා ගත් ප්‍රතිශතය 55%කි.
මෙම එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම් පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා ඉදිරි පිටුවල අන්තර්ගත වේ.

3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 3.3

II පත්‍රයේ (7) ප්‍රශ්නයේ A කොටසේ (i)හි පහසුතා දර්ශකය 0.94කි. ඒ අනුව අපේක්ෂකයන් 94% ක් නිවැරදිව පිළිතුරු සපයා ඇත. අපේක්ෂකයන් අවම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇති 4 ප්‍රශ්නයේ C (II) කොටසෙහි පහසුතා දර්ශකය 0.09කි. එනම් අපේක්ෂකයන් අතුරෙන් 9%ක් පමණක් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර සපයා ඇත.

3.5. II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය

1 ප්‍රශ්නය

1. (අ) ඔබ වෙත සපයා ඇති 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස (**ඇමුණුම අංක 01**) අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලබාදීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (**ඇමුණුම අංක 02**) යොදා ගන්න.

අංක (i) සිට (vi) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරන්න.

(i) Ⓐ අක්ෂරයෙන් දැක්වෙන ලක්ෂණය කුමක් ද?
(කලපුව / ගංමෝය / ඩෙල්ටාව) *(ලකුණු 01 යි)*

ගංමෝය

(ii) Ⓑ අක්ෂරයෙන් දැක්වෙන ස්වාභාවික වෘක්ෂලතා වර්ගය කුමක් ද?
(කඩොලාන / ලඳු කැලෑව / වගුරු බිම) *(ලකුණු 01 යි)*

වගුරු බිම

(iii) Ⓒ අක්ෂරයෙන් දැක්වෙන පරිපාලන මායිම කුමක් ද?
(ග්‍රාම නිලධාරි කොට්ඨාශය / නගර සභාව / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) *(ලකුණු 01 යි)*

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ

(iv) සිතියම් ප්‍රදේශය හරහා විහිදී ඇති දුම්රිය මාර්ගය කුමන වර්ගයට අයත් ද?
(පුළුල් ඒකීය මාර්ගය / පුළුල් ද්විතීය මාර්ගය / පටු මාර්ගය) *(ලකුණු 01 යි)*

පුළුල් ඒකීය මාර්ගය

3 km

(vi) Ⓓ අක්ෂරයෙන් දැක්වෙන රේඛාව කුමක් ද?
(සමෝච්ච රේඛාව / සම ගැඹුරු රේඛාව / මහද්වීප තටක සීමාව) *(ලකුණු 01 යි)*

(v) සිතියම් ප්‍රදේශයේ නැගෙනහිර මායිමේ සිට ප්‍රධාන මංසන්ධිය දක්වා විහිදෙන B 247 මාර්ගයේ දුර කොපමණ ද?

vii) Ⓟ අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රය තුළ සංකේත මගින් දක්වා ඇති මහජන සේවා සපයන ආයතන දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

දුම්රිය පල / පොලීසිය / පාසල (මින් දෙකක්)

(viii) සිතියම්ගත ප්‍රදේශය පිළිබඳව ප්‍රකාශ දෙකක් පහත දක්වා ඇත. ඒවා නිවැරදි නම් 'නි' යන්න ද, වැරදි නම් 'වැ' යන්න ද ලියන්න.
(a) සිතියම් ප්‍රදේශයේ වී වගාව සඳහා ප්‍රධාන වශයෙන් භාවිත කර ඇත්තේ වැව් ජලයයි.
(b) මෙම සිතියම් ප්‍රදේශය සෙමින් ගලා බස්නා ගංගාවන්ගෙන් යුත් තැනිතලා බිමකි.
(ලකුණු 02 යි)

a - වැ

b - නි

(ආ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම (**ඇමුණුම අංක 03**) අධ්‍යයනය කොට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර දැක්වෙන **අක්ෂරය සිතියමෙන්** තෝරා, **ඇමුණුම අංක 03** කඩදාසියෙහි අදාළ ස්ථානයේ එක් එක් **ප්‍රශ්න අංකය ඉදිරියේ** ලියා දක්වන්න.

(i) මීගමුව කලපුව (Ⓐ, Ⓑ, Ⓒ)

E

(ii) ගාල්ල දිස්ත්‍රික්කය (Ⓓ, Ⓔ, Ⓕ)

X

(iii) මල්වතු ඔය (Ⓙ, Ⓚ, Ⓛ)

A

(iv) මාදුරු ඔය ජලාශය (Ⓟ, Ⓠ, Ⓡ)

M

(v) එලිෆන්ට් පාස් (Ⓧ, Ⓨ, Ⓩ)

S

(ඉ) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියම අධ්‍යයනය කොට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (**ඇමුණුම 03** බලන්න).

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර හිමි **අක්ෂරය සිතියමෙන්** තෝරා, **ඇමුණුම 03** කඩදාසියෙහි අදාළ ස්ථානයේ එක් එක් **ප්‍රශ්න අංකය ඉදිරියේ** ලියා දක්වන්න.

(i) යුක්රේනය (Ⓐ, Ⓑ, Ⓒ)

W

(ii) මෙක්සිකෝ බොක්ක (Ⓓ, Ⓔ, Ⓕ)

O

(iii) මහා බෙදුම් කඳුවැටිය (Ⓙ, Ⓚ, Ⓛ)

R

(iv) කොන්ගෝ ගංගාව (Ⓟ, Ⓠ, Ⓡ)

L

(v) ටෝකියෝ නගරය (Ⓧ, Ⓨ, Ⓩ)

D

3.5.1. 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



ප්‍රස්තාරය 3.4(a)

II පත්‍රයේ I කොටසේ පළමු ප්‍රශ්නය වන මෙය සියලුම අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුතු අනිවාර්ය ප්‍රශ්නය වේ.

පළමු ප්‍රශ්නය අනුකොටස් 3කින් යුක්තය අනු කොටස් සඳහා පිළිවෙලින් ලකුණු 10, 5, 5 බැගින් හිමිවන අතර එම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 20කි.
ඉන්,
ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 9%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 38%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 39%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් ද වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 53%ක් වන අතර ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 47%ක් වේ.



ප්‍රස්තාරය 3.4(b)

පළමු ප්‍රශ්නය ප්‍රායෝගික භූගෝල විද්‍යාවේ සිතියම් කොටස් ඇසුරෙන් සකස් වී ඇත. එමෙන්ම අනු කොටස් තුනකින් මෙය සමන්විත වේ.
(අ) 1- 50000 භූලක්ෂණ සිතියම (ලකුණු 10)
(ආ) ශ්‍රී ලංකා ආකෘති සිතියම (ලකුණු 05)
(ඉ) ලෝක ආකෘති සිතියම (ලකුණු 05)

(අ) කොටසෙහි අනුකොටස් අතරින් පහසුතාව වැඩිම (i) අනුකොටසෙහි පහසුතාව 66%කි. එමෙන්ම අනුකොටස් අතරින් පහසුතාව අඩුම (v) අනුකොටසෙහි පහසුතාව 27%කි.

(i) අනුකොටසින් 1:50000 සිතියම්වල භාවිත සරල භෞතික ලක්ෂණයන් පිළිබඳ විමසා තිබීම එහි ඉහළ පහසුතාවට හේතුවක් විය හැකිය.

(v) අනුකොටසෙහි පහසුතාව අඩු මට්ටමක පැවතීමට භූලක්ෂණ සිතයම්වල පරිමාණ සංකල්පය පිළිබඳ අපේක්ෂකයන්ගේ අනවබෝධය හේතු විය හැකිය. එමෙන් ම මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සැපයීම සඳහා සිතියම් වල දැක්වෙන දිශාව වර්ණ හා සංකේත ආදිය පිළිබඳ අවබෝධයත් අවශ්‍ය වේ. එබැවින් මෙම දුබලතා මග හරවා ගත හැකි පරිදි ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලියේ නිරත ගුරුවරුන් නිසි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම වැදගත් වේ. භූ ලක්ෂණ සිතියම් පිළිබඳ නිරන්තර අභ්‍යාස වල සිසුන් වැඩි වශයෙන් යොමු කරවීමට උනන්දු විය යුතුය.

(ආ) සහ (ඉ) කොටස් සිතියමක ස්ථාන හඳුනාගැනීම ඇසුරෙන් සකස් කර ඇත. ඒ අනුව (ආ) කොටසට ශ්‍රී ලංකා ආකෘති සිතියමක් හා (ඉ) කොටසට ලෝක ආකෘති සිතියමක් ඇතුළත් වී ඇත. (ආ) කොටසෙහි පහසුතාව (ඉ) කොටසට වඩා තරමක් ඉහළ මට්ටමක පවති. (ආ) කොටසින් විමසා ඇත්තේ ශ්‍රී ලංකාවේ ස්ථානීය පිහිටීම පිළිබඳවය. එය අපේක්ෂකයන්ට බොහෝ සමීප වීම හේතුවෙන් (ආ) කොටසෙහි ශිෂ්‍ය සාධනය වැඩි වීමට හේතුවක් විය හැකිය.

සමස්තයක් ලෙස කොටස් දෙකෙහිම පහසුතාව තරමක් පහළ මට්ටමක පවතින අතර ඒ සඳහා සිතියම් හඳුනා ගැනීම හා ලකුණු කිරීම පිළිබඳ සිසුන් තුළ පවතින කුසලතාව අඩු මට්ටමක පැවතීම බලපා තිබිය හැකිය. ඒ අනුව නිරන්තර අභ්‍යාසකරණය මෙහිදී ඉතා වැදගත්ය. සෑම පාඩම් ඒකකයක් තුළදීම අවකාශිය ව්‍යාප්තිය පිහිටීම් හඳුනා ගැනීමට සිසුන් යොමු කළ යුතුය. ඒ අනුව යාවත්කාලීන වන සිතියම් ලකුණු කිරීමේ අභ්‍යාස ගොනුවක් පවත්වාගෙන යෑමටත් සිසුන් යොමු කළ යුතුය.

II කොටස

2 ප්‍රශ්නය

2. ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප යාබද සිතියමේ දක්වා ඇත.



(අ) අංක ① හා ⑤ කලාප නම් කරන්න. *(ලකුණු 02 යි)*

පහත රට තෙත් කලාපය

අර්ධ ශුෂ්ක කලාපය

(ආ) අංක ③ දක්වා ඇත්තේ කඳුකර තෙත් කලාපයයි. එහි දේශගුණික ලක්ෂණ තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

- වසර පුරාම වර්ෂාපතනය ව්‍යාප්තව පවතී.
- නිරිත දිග මෝසම් හා සංවර්ධන වර්ෂා මගින් වැඩි වැස්ස ලැබේ.
- සාමාන්‍ය වාර්ෂික ව්‍යාප්තිය 3400 mm පමණ වේ.
- ශ්‍රී ලංකාවේ වැඩිම වැස්ස ලැබෙන ප්‍රදේශ මෙම කලාපයට අයත්ය. (වටවල බාලිබොඩ)
- වියළි සෘතුවක් නොමැත.
- අනුව උෂ්ණත්වය වෙනස් වේ. (මහනුවර 20°C , නුවර එළිය 15°C)

(ඉ) (i) අංක ②න් දක්වා ඇති වියළි කලාපීය ප්‍රදේශවල විශාල වශයෙන් වී වගාව ව්‍යාප්ත වීමට බලපා ඇති සාධක **දෙකක්** දක්වන්න.

(a)

- වී වගාවට සුදුසු දේශගුණයක් පැවතීම
- තැනිතලා බිම
- දියළු පස (ගංගා ස්ථාන ආශ්‍රිතව)
- ජල නිෂ්පාදනය

(ii) ඉහත ඔබ නම් කළ සාධකවලින් **එකක්** තෝරාගෙන වී වගාවට එහි ඇති බලපෑම විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

සාධක 2 දැක්වීමට ලකුණු 02යි.

විස්තරයට ලකුණු 03යි.

(ලකුණු (03+02=05යි)

(මුළු ලකුණු 10යි)

3.5.2. 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



ප්‍රස්තාරය 3.5(a)

II පත්‍රයෙහි II කොටස අයත් මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 3.1 ප්‍රස්තාරයට අනුව 40%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමිවන අතර ඉන්

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 40%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 37%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 15%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 8%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙහි ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 23%ක් වන අතර ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 77%ක් වේ.



ප්‍රස්තාරය 3.5(b)

(2) වන ප්‍රශ්නය දේශගුණය ඒකකයට අදාළව සකස්කර ඇති අතර එහි කොටස් 3කි. (ඉ) කොටසෙහි අනුකොටස් 2කි.

(අ) කොටසේ පහසුතාව 26%ක් වන අතර (ආ) කොටසේ එම අගය 20%ක් වේ. (ඉ) කොටස (i) හා (ii) ලෙස අනුකොටස් 2කි. ඉන් (i) අනුකොටසෙහි පහසුතාව 33%ක් වන අතර (ii) අනුකොටසෙහි පහසුතාව 40%ක් වේ.

(අ) කොටසේ ප්‍රශ්නය යොමු කර ඇත්තේ සිතියම ඇසුරින් ව්‍යාප්තීන් හඳුනා ගැනීම සඳහාය. එහෙත් සිතියම් ආශ්‍රිත අභ්‍යාසවලට අපේක්ෂකයන් පොදුවේ දක්වන දුර්වලතාව මෙහි පහසුතාව අඩු වීමට හේතු වී තිබිය හැකිය. නිරන්තර අභ්‍යාසකරණය මේ සඳහා විසඳුම ලෙස යෝජනා කළ හැකිය.

(ආ) කොටහි ප්‍රශ්නය දේශගුණික කලාප පිළිබඳ සකස් කර ඇත. එහි පහසුතාව ද ඉතාම අඩුය. මතකය සහ අවබෝධය පහළ මට්ටමක පැවතීම පෙළපොත් භාවිතය අඩු වීමද මෙයට යම් බලපෑමක් සිදු කර ඇති බව සිතිය හැකිය. දැනුම සහ අවබෝධය තහවුරු කිරීමට විවිධ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම අනුගමනය කිරීම මගින් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමට කටයුතු කළ හැකිය.

(ඉ) කොටසෙහි අනුකොටස් දෙකෙහිම පහසුතාව පහළ මට්ටමක පැවතිය ද එය (අ) සහ (ආ) කොටස්වලට වඩා වැඩි පහසුතාවකි. ශ්‍රී ලංකාවේ වී වගාව සහ භෞතික සාධක සංකලනය කර පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයකි. එහිදී අපේක්ෂකයන් සතු විශ්ලේෂණ හැකියාව අඩු වීම පහසුතාව අඩු වීමට හේතු වී ඇති බව පැහැදිලිය. භෞතික පරිසරය සහ මානුෂ ක්‍රියාකාරකම් අතර අන්තර් සම්බන්ධතාව පැහැදිලි වන සේ ඉගෙනුම් අත්දැකීම් තහවුරු කිරීමට උත්සාහ ගත යුතුය.

03 ප්‍රශ්නය

3. (අ) පෙට්රෝලියම්, ජලය, හිරු එළිය, ශාක යන ස්වාභාවික සම්පත්
(i) ජෛවීය
(ii) අජෛවීය ලෙස බෙදා දක්වන්න. (ලකුණු 02 යි)

A - ජෛවීය ඛනිජතෙල් ශාක

B - අජෛවීය ජලය, හිරු එළිය

(1 x 2 = ලකුණු 02යි)

(ආ) පස නිර්මාණය වීමට බලපාන සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

- මව් පාෂාණය
- දේශගුණය
- භූවිෂමතාව
- ජීවීන්
- කාලය
- ශාක

(1 x 2 = ලකුණු 03යි)

(ඉ) ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශවල පාංශු සම්පත ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** තෝරාගෙන එය පාංශු සංරක්ෂණයට දායක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

- උස් ස්ථාන වල වන වගාව
- වන රක්ෂිත නම් කිරීම හා ආරක්ෂා කිරීම
- සමෝච්ච ක්‍රමයට වගා කිරීම (හෙල්මළු වගාව)
- ජලය බැස යාමට නෛත්ති කානු යෙදීම
- බෑවුම් ප්‍රදේශවල සංරක්ෂිත බෝග වගා කිරීම.
- සුළං බාධක ලෙස ශාක වගා කිරීම.

ක්‍රියාමාර්ග 2 දැක්වීමට ලකුණු 02යි.
විස්තරයට ලකුණු 03යි.
(ලකුණු 05යි)
(2 + 3+5 = මුළු ලකුණු 10යි)

3.5.3. 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



3 . 1 ප්‍රස්තාරයට අනුව අපේක්ෂකයන් 60%ක් පමණ මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත. ප්‍රශ්නය සඳහා හිමි ලකුණු 10 ප්‍රාන්තර අනුව පහත අකාරයට බෙදා දැක්විය හැකිය.

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 08%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 44%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 35%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 13%ක් ද

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙහිදී ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 48%ක් වේ. අපේක්ෂකයන් 52%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත

ප්‍රස්තාරය 3.6(a)



ප්‍රස්තාරය 3.6(b)

(අ) කොටස බලශක්තිය පිළිබඳව විමසා ඇති අතර එහි පහසුතාව ඉහළ මට්ටමක පැවතීමට ස්වභාවික සම්පත් වර්ග කිරීම වැනි සරල විෂය කරුණකට පමණක් සීමා කිරීම විය හැකිය.

(ආ) කොටසේ පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතී. පෙළ පොත භාවිතය ප්‍රමාණවත් ලෙස සිදු වූවා නම් ශිෂ්‍ය සාධනය වඩා වැඩි වීමට හැකිව තිබුණි.

(ඉ) කොටසෙහි අනුකොටස් දෙකක් ඇති අතර ඒ දෙකෙහිම පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවති. විවේචනාත්මක චින්තනය හා නිර්මාණාත්මක බව ඉස්මතු කෙරෙන ප්‍රශ්නයක් වන මෙය එවැනි හැකියා තව දුරටත් සංවර්ධනයට අවස්ථා සැලසීමෙන් ශිෂ්‍ය සාධනය වැඩි කර ගැනීම සිදු කළ හැකි වේ.

04 ප්‍රශ්නය

4. (අ) ලෝකයේ අධිකතම ජන සංඛ්‍යාවක් වාසය කරන රටවල් **දෙක** නම් කරන්න. *(ලකුණු 02 යි)*

චීනය

ඉන්දියාව

(ලකුණු 02යි)

(ආ) ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත තුළ අධික ජන සංඛ්‍යාවක් වාසය කිරීමට බලපා ඇති හේතු **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

- අගනුවර පිහිටීම - පාලන ක්‍රමය
- වෙළඳ නගර පිහිටා තිබීම - වෙළඳ කලාප
- කර්මාන්ත ව්‍යාප්ත වීම
- රැකියා අවස්ථා බහුල වීම
- අධ්‍යාපන, මහාමාර්ග සේවා පහසුකම් බහුල වීම

(1 ×3 ලකුණු 03යි)

(ඉ) (i) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ නව ප්‍රවනතා **දෙකක්** සඳහන් කරන්න.
(ii) ඉන් **එකක්** තෝරාගෙන එය ගැටළුවක් වන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

- ජන සංඛ්‍යාව වියපත් වීම
- නාගරික ජන සංඛ්‍යාව වැඩි වීම
- ජනගහනයේ සඵලතාව අඩු වීම

ප්‍රවනතා 2 දැක්වීමට ලකුණු 02යි
විස්තරයට ලකුණු 02යි
(2 +3 ලකුණු 05යි)
(2 +3+5 මුළු ලකුණු 10යි)

3.5.4. 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



ප්‍රස්තාරය 3.7(a)

3.1 ප්‍රස්තාරයට අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 76.25% කි. 2 සිට 8 දක්වා වන ප්‍රශ්න අතුරින් වැඩිම අපේක්‍ෂක සංඛ්‍යාවක් පිළිතුරු සැපයීම සඳහා මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත. ප්‍රශ්නයට හිමි ලකුණු 10 පහත පරිදි බෙදී ගොස් ඇත.

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 47%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 15%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 15%ක් ද

ලෙස අපේක්‍ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්‍ෂකයන් ප්‍රමාණය 30%ක් වන අතර ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්‍ෂකයන් ප්‍රමාණය 70% කි.



ප්‍රස්තාරය 3.7(b)

(අ) කොටසේ පහසුතාව 77%කි. මෙය ලෝක ජන සංඛ්‍යාව ආශ්‍රිත ප්‍රමුඛ රටවල් දෙකක් නම් කිරීම වැනි සරල විෂය කරුණක් විමසීම සඳහා යොමු වී ඇත. පහසුතාවය වැඩි වීමට එය හේතු විය හැකිය.

(ආ) කොටසේ පහසුතාව 46%කි. ශිෂ්‍යයන්ගේ විවේචනාත්මක චින්තනය හා භාවිතය වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අනුගමන කළේ නම් ශිෂ්‍ය සාධනය තව දුරටත් වර්ධනය කරගත හැකිව තිබුණි.

(ඉ) කොටසේ අනුකොටස් දෙකෙහිම පහසුතාව සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පවතී. මතකය හා අවබෝධය අඩුවීමත් භාවිතය අවම වීමත් අඩු ශිෂ්‍ය සාධනයට හේතු වී ඇතැයි නිගමනය කළ හැකිය. එමෙන්ම ප්‍රශ්නයක් විග්‍රහාත්මකව පැහැදිලි කිරීම සඳහා අපේක්ෂකයන් සතු අනවබෝධයද මෙයට හේතුවක් විය හැකිය.
සිසුන් තුළ මෙම හැකියාව වර්ධනය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය.

05 ප්‍රශ්නය

5. (අ) ලෝකයේ ආර්ථික කටයුතු අතර කෘෂිකර්මාන්තය තවදුරටත් වැදගත් වන බව දැක්වීම සඳහා ඉදිරිපත් කළ හැකි හේතුසාධක දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

- ලෝකයේ වැඩිම බිම් ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය සඳහා යොදාගෙන තිබීම.
- බහුතර ජන කොටසක් කෘෂි අංශයේ රැකියාවල නියුක්ත වීම.
- වැඩි පිරිසක් සෘජුව හෝ වක්‍රව කෘෂිකර්මාන්තයට සම්බන්ධ වීම.
- කාර්මික ක්ෂේත්‍රයට අමුද්‍රව්‍ය සැපයීම.
- ලෝක වෙළඳාමේ දී කෘෂිකර්මාන්තයට වැඩි තැනක් හිමි වීම.
- සියලුම මිනිසුන්ගේ ආහාර අවශ්‍යතාව ඒ මත රැඳී පැවතීම.

(2 × 3 ලකුණු 02යි)

(ආ) ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා රජය මගින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

- පොල් පර්යේෂණ ආයතන කටයුතු පුළුල් කිරීම.
- උපදේශන සේවා
- සහනාධාර සැපයීම / කෙටි කාලීන ඵල ලැබෙන ව්‍යාපාර හඳුන්වා දීම.
- ණය පහසුකම් හඳුන්වා දීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය
- නව වගා බිම් ඇති කිරීම.

(1 × 3 ලකුණු 03යි)

(ඉ) (i) ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග වගාව ප්‍රවර්ධනය වීම සඳහා බලපෑ සාධක **තුනක්** දක්වන්න.
(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සුළු අපනයන බෝග වගාව ලබාදෙන දායකත්වය පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

- සාම්ප්‍රදායික අපනයන වල මිල පහළ යෑම.
- සුළු අපනයන බෝග විදේශ වෙළඳපොල පුළුල් වීම.
- දේශීය ගොවියන්ගේ ආදායම වැඩි වීම.
- අතුරු වගාවක් ලෙස වගාකල හැකි වීම.
- රැකියා අවස්ථා බිහි වීම.

(1×3 ලකුණු 03යි)
විස්තරයට ලකුණු 02යි
(2 +3 ලකුණු 05යි)
(2 +3+5 මුළු ලකුණු 10යි)

3.5.5. 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 58. 75% කි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10 පහත පරිදි බෙදීගොස් ඇත.

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 41%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 34%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 2%ක් ද

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6 ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 36%ක් වන අතර ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 64%කි.

ප්‍රස්තාරය 3.8(a)



ප්‍රස්තාරය 3.8(b)

(අ) කොටසේ පහසුතාව 30%කි. මෙය ලෝක ආර්ථික කටයුතු යටතේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ප්‍රශ්නයකි.විමසා ඇති කරුණු සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ ස්මරණ ශක්තිය අඩු වීම හා පෙළ පොත භාවිතය අඩු වීම මෙහි අඩු ශිෂ්‍ය සාධනයට හේතු විය හැකිය.

(ආ) කොටසේ පහසුතාව 50%කි. එනම් මධ්‍යස්ථ මට්ටමකි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යාවත්කාලීන කරන ලද විෂය කරුණු හා පෙළපොතේ සඳහන් විෂය කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම මගින් පහසුතාව තව දුරටත් වැඩිකර ගත හැකිය.

(ඉ) කොටසේ (i) (ii) ලෙස අනුකොටස් 2කි. 1 අනුකොටසෙහි පහසුතාව 28%ක් ද (ii) අනුකොටසෙහි පහසුතාව 36%ක් ද වේ. සමස්තයක් ලෙස බලන විට පහසුතාව අඩු මට්ටමක පවතී. මෙම ප්‍රශ්න යොමු කර ඇත්තේ ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග ප්‍රවර්ධනය පිළිබඳ විමසීම සඳහාය. පෙළපොතේ සඳහන් කර ඇති කරුණු විමර්ශනාත්මකව ඉස්මතුවන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනයට කර ගැනීමෙන් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකිය.

06 ප්‍රශ්නය

6. (අ) සීනි, සිමෙන්ති, ටයර්, පිඟන් භාණ්ඩ යන කර්මාන්ත ⓐ කෘෂිපාදක හා ⓑ ඛනිජ පාදක කර්මාන්ත ලෙස වෙන් කර දක්වන්න. *(ලකුණු 02 යි)*

සීනි,ටයර්

පිඟන් භාණ්ඩ, සිමෙන්ති **(ලකුණු 02 යි)**

(ආ) ලෝක ඇඟලුම් කර්මාන්තයේ නව ප්‍රවනතා **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

- ඉල්ලුම් දිගින් දිගටම ඉහළ යාම
- අත් යන්ත්‍ර රෙදි පිළි සඳහා විශාල වෙළඳපලක් පැවතීම.
- ශ්‍රමය අඩු මුදලට ලබා ගැනීමට හැකි වීම නිසා දියුණු වෙමින් පවතින රටවල කර්මාන්තය ස්ථානගත වීම.
- නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය
- අලුත් විලාසිතා දිනෙන් දින දියුණු වීම.
- බහුජාතික සමාගම්වල දායකත්වය

(ඉ) (i) කොවිඩ් 19 රෝගය ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වීම නිසා මෙරට සංචාරක කර්මාන්තය මුහුණ පෑ ගැටලු **තුනක්** සඳහන් කරන්න.

(ii) එම ගැටලු ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බලපෑ ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි,*

- සංචාරකයන්ගේ පැමිණීම සීඝ්‍රයෙන් පහළ බැසීම.
- රටට ලැබෙන විදේශ විනිමය අඩු වීම.
- ඍජු රැකියා කරන්නවුන්ගේ ආදායම අඩු වීම.
- වක්‍ර රැකියා කරන්නවුන්ට රැකියා අහිමි වීම.
- දේශීය ගෘහ කර්මාන්ත නිෂ්පාදන අලෙවිය අඩු වීම.

(1×3 ලකුණු 03යි)

විස්තරයට ලකුණු 02යි

(2 +3 ලකුණු 05යි)

(2 +3+5 මුළු ලකුණු 10යි)

3.5.6. 6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



ප්‍රස්තාරය 3.9(a)

3. 1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 63.75%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි අතර ඉන්,

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 31%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 08 - 010 ප්‍රාන්තරයේ 24 ක් ද

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රමාණය 49%ක් වන අතර ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 51%කි.



ප්‍රස්තාරය 3.9(b)

(අ) කොටසේ අනුකොටස් 2කි. ඉන් (a) කොටසේ පහසුතාව 85%කි. (b) කොටසේ පහසුතාව 76%කි. කර්මාන්ත කීපයක් වර්ග කිරීම සඳහා අවස්ථාව ලබා දී ඇති ප්‍රශ්නයකි. කර්මාන්ත කිහිපයක් සපයා වර්ග කිරීමට ලබා දීම ශිෂ්‍ය සාධනය වැඩි වීමට හේතු වී ඇතැයි කිව හැකිය. පාරිභාෂිත වචන පිළිබඳ අපේක්ෂකයන් තුළ අවබෝධයක් පැවතීම ද ඉහළ ශිෂ්‍ය සාධනයට හේතු වී තිබිය හැකිය.
(ආ) කොටසේ පහසුතාව අඩු මට්ටමක පවතී. එය 28%කි. අපේක්ෂකයන් විසින් විෂය කරුණු අවබෝධයෙන් ග්‍රහණය කර නොගැනීම මෙම අඩු ශිෂ්‍ය සාධනයට හේතු වී තිබිය හැකිය.
(ඉ) කොටස අනුකොටස් 2 කින් යුක්තය. (i) අනුකොටසේ පහසුතාව 53%කි. (ii) අනුකොටසේ පහසුතාවය 56% කි. මේ අනුව (ඉ) කොටසේ පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතී.
විෂය දැනුම වර්තමාන සමාජ ආර්ථික තත්වයන් ට ගැලපෙන ලෙස යොදා ගැනීම පිළිබඳ විමසීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ. මෙම ප්‍රශ්නය පදනම් වී ඇත්තේ කොවිඩ් 19 රෝගය පැතිරීම නිසා ඇති වූ සමාජ ආර්ථික බලපෑම් පිළිබඳවයි. මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා සිසු දැනුම නිරන්තරයෙන් නූතන තොරතුරු ඔස්සේ යාවත්කාලීන විය යුතුය. රට තුළ ඇතිවන නව සමාජ ආර්ථික තත්වයන් කෙරෙහි භූගෝල විද්‍යාත්මක බලපෑම කෙසේද යන් පිළිබඳව සිසු අවධානය නිරන්තරයෙන් යොමු විය යුතුය. එවැනි අවස්ථාවන් පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ප්‍රමාණවත් තරම් වර්ධනය වී නොමැති බව ඉහත දත්ත මගින් පැහැදිලි වේ.

07 ප්‍රශ්නය

භූමි කම්පා, නියඟ, සුනාමි, වසංගත රෝග

(අ) ඉහත දැක්වෙන ආපදා

(i) ක්ෂණිකව ඇති වී ප්‍රබල බලපෑමක් ඇති කරන

(ii) සෙමෙන් ව්‍යාප්ත වී දිගු කාලයක් තුළ බලපෑමක් ඇති කරන ලෙස වර්ග කර දක්වන්න.

(ලකුණු 02 යි)

- භූමි කම්පා, සුනාමි
- නියඟ, වසංගත රෝග

(ලකුණු 02යි)

(ආ) ශ්‍රී ලංකාවේ ජලගැලීම් ඇති වීම සඳහා බලපාන මානුෂ ක්‍රියාකාරකම් **තුනක්** සඳහන් කරන්න.

(ලකුණු 03 යි)

- ජල මාර්ග අවහිර කිරීම
- ගං මෝය අවහිර කිරීම
- පහත් බිම් ගොඩ කිරීම
- උස් ප්‍රදේශවල වෘක්ෂලතා වැඩීම ඉවත් කිරීම.
- පහත් බිම්වල ජනාවාස සංකීර්ණ ඇති කිරීම.
- අනවසර ඉදි කිරීම්.

(ඉ) (i) යාබද සටහනේ දැක්වෙන ආපදා කළමනාකරණ චක්‍රයේ ❶ හා ❷ අවස්ථා නම් කරන්න.

(ii) ආපදා අවම කිරීමේ අවස්ථාවේ දී ගත යුතු ක්‍රියාමාර්ග ආපදාවක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*



(i)

- පෙර සූදානම
- ප්‍රතිචාර දැක්වීම

(ii)

- අනතුරු ඇඟවීමේ පද්ධති ස්ථාපිත කිරීම
- ප්‍රජාව දැනුවත් කිරීම
- ප්‍රජා සහභාගීත්වය
- වෙවලම් හඳුන්වා දීම
- ආයතන ශක්තිමත් කිරීම

(1×2 ලකුණු 02යි)

විස්තරයට ලකුණු 03යි

3.5.7. 7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



ප්‍රස්තාරය 3.10(a)

3. 1 ප්‍රස්තාරයට අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂයන් ප්‍රමාණය 61.25% කි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10 පහත පරිදි බෙදී ගොස් ඇත.

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 55%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 19%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 12%ක් ද
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂක සංඛ්‍යාව 31%කි. අපේක්ෂකයන්ගෙන් 69%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.



ප්‍රස්තාරය 3.10(b)

(අ) කොටස අනුකොටස් 2කින් යුක්තය. (i)හි පහසුතාව 94%ක් වන අතර (ii)හි පහසුතාව 89%කි. මෙම ප්‍රශ්නය ආපදා වර්ගීකරණය පිළිබඳව විමසා ඇති සරල විෂය කරුණක් ආශ්‍රිත පහසු ප්‍රශ්නයක් නිසා ඉහළ පහසුතාවට එය හේතුවක් විය හැකිය. (ආ) කොටසේ පහසුතාව 57%කි. නිරන්තරයෙන් සමාජයේ අවධානයට ලක්වන මෙම තේමාවෙන් විමසන අකාරයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ශිෂ්‍යයන් උනන්දු කරවීම හා පුරුදු පුහුණු කිරීම තුළින් එවැනි ප්‍රශ්න සඳහා ශිෂ්‍ය සාධනය ඉහළ නංවා ගත හැකි අතරම එය එදිනෙදා ජීවිතයේ අභියෝග ජය ගැනීමටද වැදගත් වේ.
(ඉ) කොටස අනුකොටස් 2කි. (i) අනුකොටසේ පහසුතාව 25%ක් වන අතර (ii) අනුකොටසේ පහසුතාව 17%කි. සමස්තයක් ලෙස මේ කොටසේ පහසුතාව සාපේක්ෂව අඩු මට්ටමක පවතී. ආපදා කළමණාකරණ චක්‍රයේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුවත්භාවය පහළ මට්ටමක පැවතීම මෙයට හේතු විය හැකිය. එය වර්ධනය කර ගැනීමට අවශ්‍ය ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කර වීම වැදගත් වේ.

08 ප්‍රශ්නය

(අ) යාබද සිතියමේ අංක ❶ හා ❷ වශයෙන් ඇති ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන දෙක නම් කරන්න.



(ලකුණු 02 යි)

- යාල ජාතික උද්‍යානය
- විල්පත්තු උද්‍යානය (1×2 ලකුණු 02යි)

(ආ) ශ්‍රී ලංකාවේ වනාන්තර වැස්ම ක්‍රමයෙන් අඩු වීමට බලපා ඇති මානව ක්‍රියාකාරකම් **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

- අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති
- වන හරණය (ගස් කැපීම)
- හොර ජාවාරම්
- පතල් කැණීම, ඛණිජ, පස්වැලි කැනීම
- ඖෂධ හා වන ද්‍රව්‍ය අවිධිමත් ලෙස එකතු කිරීම නිසා වන හානිය
- අනවසර නිවාස, වගාබිම් නිසා
- වනාන්තර ගිනි තැබීම හා දඩයම

(ඉ) ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ වැදගත්කම දැක්වෙන බෞද්ධ ඉගැන්වීම් **තුනක්** උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

- පරිසර සංරක්ෂණයේ වැදගත්කම දැක්වෙන බෞද්ධ ඉගැන්වීම් රාශියකි.
- එකම සම්පත නැවත නැවත භාවිතය උදා -: සිවුරු
- ගස්වල කොල අතු කඩා නොදමන ලෙස අවවාද කිරීම.
- ගස් කැපීම තහනම් කොට පැනවු නීති
- ජල සම්පත ආරක්ෂා කිරීම සඳහා පැනවූ නීති
- වන රෝප / ආරාම රෝප
  උදාහරණ 03ක් සමග විස්තරයට

(ලකුණු 05යි)

(2 +3+5 මුළු ලකුණු 10යි)

3.5.8. 8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



3.1 ප්‍රස්තාරයට අනුව මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 30% කි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10 පහත පරිදි බෙදී ගොස් ඇත.

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 50%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 13%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 4%ක් ද
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 17%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 83%කි.

ප්‍රස්තාරය 3.11(a)



ප්‍රස්තාරය 3.11(b)

(අ) කොටසේ පහසුතාව 55%කි. සිතියම් හඳුනා ගැනීම ආශ්‍රිත ප්‍රශ්නයක් වන මේ සඳහා අපේක්ෂකයන් පොදුවේ සිතියම් පිළිබඳ දක්වන දුර්වලතාව අඩු ශිෂ්‍ය සාධනයට හේතු වී තිබිය හැක. ඒ අනුව සිතියම් ලකුණු කිරීම සහ ස්ථාන හඳුනා ගැනීම පිළිබඳ කුසලතා වඩාත් වර්ධනය කළ යුතු බව මෙයින් ද පැහැදිලි වේ.

(ඉ) කොටසේ පහසුතාව 26%කි. එය ඉතා පහළ මට්ටමකි. මේ සඳහා විෂය සහ බෞද්ධ ඉගැන්වීම් එකිනෙක ගැලපීම හා ඒවා උදාහරණ ඇසුරින් සාකච්ඡා කර නොතිබීම මෙම අඩු ශිෂ්‍ය සාධනයට හේතුවක් විය හැකිය. ඒ පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමු කළ යුතුය.

3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ප්‍රතිශතය, ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු, සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



ප්‍රස්තාරය 3.12

II පත්‍රයේ I කොටසේ ඇතුළත් පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. අපේක්ෂකයන් 100%ක් තෝරාගෙන ඇති අතර පහසුතාව 51%කි. පහසුතාව අඩුවීමට ප්‍රධාන හේතුවක් විය හැක්කේ ප්‍රායෝගිකව සිතියම් අභ්‍යාසවල නිරත නොවීමයි. එමෙන්ම භූගෝල විද්‍යාවේ එක් ප්‍රධාන තේමාවක් වන සිතියම් අධ්‍යායනය පිළිබඳව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වන්නන් තව දුරටත් තම කුසලතා ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.

අනිවාර්ය පළමු ප්‍රශ්නය හැර තෝරා ගැනීමට ඇති ප්‍රශ්න අතරින් වැඩිම අපේක්ෂකයන් පිරිසක් එනම් 76% ක් පිළිතුරු සපයා ඇත්තේ 4 ප්‍රශ්නයටයි. එහෙත් එහි පහසුතාව 49%කි. ඒ අනුව එම ප්‍රශ්නය තෝරා ගත්තද පිළිතුරු ලිවීමේදී ii හා iii කොටස් සඳහා සිසුන්ගේ සාධනය දුර්වල මට්ටමක පවතින බව පැහැදිලිය. ප්‍රශ්න තෝරා ගැනීම පිළිබඳ අපේක්ෂකයන් වඩාත් සැලකිලිමත් විය යුතු බව අවධාරණය කළ යුතුය. ප්‍රශ්නයක පළමු කොටස පමණක් කියවා පිළිතුරු සැපයීමට සූදානම් නොවිය යුතු අතර සමස්ත කොටස් සියල්ලම කියවා පිළිතුරු සැපයීමට සුදුසු ප්‍රශ්නය තෝරාගැනීම සිදුකළ යුතු බව සිසුන්ට අවධාරණය කිරීමත් වැදගත්ය.

6 සහ 7 ප්‍රශ්න තෝරාගෙන ඇති අපේක්ෂක සංඛ්‍යාව 60% ආසන්නයේ පවතින අතර එම ප්‍රශ්නවල පහසුතාව 90% ට වඩා ඉහළය. ඒ අනුව පහසු ප්‍රශ්න මග හැර අපහසු ප්‍රශ්නවල යොමු වීම අවම කර ගැනීමට උනන්දු විය යුතුය.

පහසුතාව අඩුම ප්‍රශ්නය ලෙස ප්‍රශ්න අංක 2 දැක්විය හැකි අතර එහි පහසුතාව 40%කි. අපේක්ෂකයන් අතුරෙන් 50%ක් පමණ එම ප්‍රශ්නය තෝරා ගෙන ඇත. පිළිතුරු ලිවීමේ දී විෂය කරුණු විශ්ලේෂණාත්මකව අධ්‍යයනය සඳහා සිසුන් යොමු කිරීම තුළින් මෙවැනි ප්‍රශ්නවල පහසුතාව ඉහළ මට්ටමක ගෙන ආ හැකිය.

4 පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු

• ප්‍රශ්න පත්‍රය සඳහා ලබා දී ඇති පොදු උපදෙස් පිළිබඳ අවධානය යොමු කර පිළිතුරු සැපයීම වැදගත්ය. ඒ අනුව අනිවාර්ය ප්‍රශ්නය සහ අනෙකුත් ප්‍රශ්න සඳහා ගතවන කාලය පිළිබඳ වඩාත් සැලකිලිමත් විය යුතුය.සමහර ප්‍රශ්නවලට අනවශ්‍ය කාලයක් වැය කර, තවත් අත්‍යවශ්‍ය ප්‍රශ්නයකට අඩු කාලයක් වැය කරන අවස්ථා පිළිතුරු පත්‍ර ඇගයීමේදී පැහැදිලි වේ. සිසුන් පිළිතුරු සැපයීමට වැඩි වශයෙන් තෝරාගෙන ඇති ප්‍රශ්නවල සාධන මට්ටම පහළ අගයක් ගෙන ඇති බව පෙනේ. ඉන් පැහැදිලි වන්නේ ප්‍රශ්න තෝරා ගැනීමේදී ප්‍රශ්න පත්‍රයේ මුල් කොටස්වලට පමණක් වැඩි අවධානයක් යොමු කරන බවය. ප්‍රශ්න තෝරා ගැනීම පිළිබඳ සිසුන් දැනුවත් කිරීම වඩාත් සුදුසුය. එමෙන්ම නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට වඩා වැඩියෙන් පිළිතුරු සැපයීම නොකළ යුතුය. ප්‍රශ්න පත්‍රය කියවීමට ලබා දෙන කාලය (අමතර වි.10) මේ සඳහා යොදා ගෙන වඩාත් පහසු ප්‍රශ්න තෝරා ගත යුතුය.
ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය තුනකි.(වි. 180 කි)

• පත්‍රයේ I කොටස සඳහා වි 40 ක කාලයක් ද II කොටසෙහි ප්‍රශ්න හතර සඳහා වි.80 ක කාලයක්ද (20x 4) යොදා ගැනීම සුදුසු බව යෝජනා කෙරේ.
ඉතිරි කාලය (වි. 10) වැඩ අවසන් කර පිළිතුරු පත්‍ර පරීක්ෂා කර ගොනුකර භාර දීම සඳහා යොදා ගැනීම සුදුසු වේ.

• I පත්‍රයට පිළිතුරු , ලබා දී ඇති උපදෙස්වලට අනුව ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුය.

• II පත්‍රයේ පළමු කොටසට පිළිතුරු සැපයීමේ දී ඒ සඳහා ලබා දී ඇති ඇමුණුම් යොදාගත යුතුය.

• II පත්‍රයේ II කොටසින් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතුය.

• ඒ අනුව II පත්‍රයේ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

• පිළිතුරු සැපයීමේ දී ප්‍රශ්න අංක සහ අනු අංක පැහැදිලිව දැක්විය යුතුය.

• පරීක්ෂකවරයාට කියවිය හැකි සේ නිවැරදි සහ පැහැදිලි අත් අකුරු භාවිත කළ යුතුය.

• සෑම පිළිතුරු පිටුවකම විභාග අපේක්ෂකයාගේ අංකය සහ පිටු අංකය පැහැදිලිව දැක්විය යුතු අතර පිටු අංක අනුව ඇමිණිය යුතුය.

• මුල් පිටුවට අදාළ තොරතුරු නිවැරදිව දැක්විය යුතුය.

5 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

■ භූගෝල විද්‍යාව විෂය ඉගැන්වීම සඳහා විෂය පිළිබඳ ප්‍රවීණ වූ සුදුසුකම් සහිත ගුරුවරුන් යොදාගත යුතුය. ඒ වැනි සුදුසු ගුරුවරුන් නොමැති නම් ඔවුන් විෂය දැනුමෙන් යුතු පිරිසක් බවට පත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

■ පරිසර හා සම්බන්ධ විෂයයක් නිසා නිරන්තර සුථත්‍ය ඉගෙනුම් ක්‍රම භාවිතය සඳහා යොමු වීමට මග පෙන්වීම.

■ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත විෂයයක් නිසා හැකි සෑම විටම සිසුන් ඒ සඳහා යොමු කිරීම.

■ නිරන්තරව යාවත්කාලීන වන විෂය කරුණු පිළිබඳ දැනුම්වත්භාවය වර්ධනය කිරිම.

■ නූතන තාක්ෂණික උපකරණ භාවිතය පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.

■ විෂයයට අදාළ විශේෂිත ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ සැකසීම හා භාවිතයට යොමු කිරීම.එවැනි උපකරණ තබා ගැනීමට නියමිත ස්ථානයක් සකස් කර ගැනීම.

■ භූගෝල විද්‍යාත්මක සංකල්ප ඇසුරින් එදිනෙදා ජීවිතයේ ගැටලු විසදා ගැනීමට යොමු කිරිම.

■ සිතියම් අභ්‍යාසකරණය පිළිබඳ නිරන්තර අවධානය යොමු කිරීම.සියලු පාඩම් ඇසුරින් සිතියම් අභ්‍යාස එකතුවක් පවත්වා ගැනීම.

■ පෙරහුරු අභ්‍යාස නිරතුරුව භාවිත කිරීම සඳහා සිසුන් සහභාගි කරවීම.

■ නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රම (G1S,GPS,RS) පිළිබඳව පාඨමාලා හැදෑරීමට යොමු කිරීම.

Printed by
Department of Examinations Press